විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS

ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

පරපුරක අභිමානය    தலைமுறையொன்றின் பெருமிதம்    Pride of a Generation

මගේ අංකය / எனது இல. / My No.: විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි අංක: 9/2021    ඔබේ අංකය / உமது இல. / Your No.: ..........    දිනය / திகதி / Date: 2021.04.30

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්.

**විශ්‍රාම වැටුප් ලබන අයෙකුට විශ්‍රාම වැටුප් ලබා ගැනීමට පැමිණීම අපහසු අවස්ථාවක භාරකරුවෙකු පත් කිරීම පිළිබඳ ගිවිසුම**

උක්ත මැයෙන් මවිසින් නිකුත් කරන ලද, 2020.06.11 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 07/2020 හා 2021.01.07 දිනැති විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි අංක 01/2021 හි සඳහන් උපදෙස් වලට අමතර වශයෙන් පහත උපදෙස් නිකුත් කරමි.

I. භාරකරුවෙකු පත්කිරීම සම්බන්ධයෙන් පූර්ණ බලතල ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත පවරා ඇත.

II. භාරකරුවන් කිහිපදෙනෙකු ඉදිරිපත් වන අවස්ථාවන්හි දී යම් ගැටළු සහගත තත්ත්වයක් මතු වන්නේ නම් පමණක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් නිර්දේශ සහිතව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත දැනුම්වත් කිරීම හා ඒ අනුව, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව භාරකරුවෙකු පත් කිරීම.

III. භාරකරු නම් කල පසුව, භාරකරුගේ විස්තර අදාල ආකෘතියට අනුව මාසික විශ්‍රාම වැටුප් ගෙවීම් දත්ත පද්ධතියට යාවත්කාලීන කිරීම සඳහා මධ්‍යම දත්ත පද්ධතියේ AR මඟින් මාර්ගගතව යොමු කිරීමට කටයුතු කල යුතු ය.

IV. රණවිරු සෙවණ, වැඩිහිටි නිවාසයන් ආදී ස්ථානවල විශ්‍රාමිකයා රැඳී සිටින විට හා භාරකරු වෙනත් ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයක පදිංචි වී සිටින විට, භාරකරු පදිංචි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අදාළ ගෙවීම් සිදු කිරීමට විශ්‍රාමිකයාගේ ගොනුව භාරකරු පදිංචි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත මාරු කර යැවිය යුතු ය. එසේ නොවන අනිකුත් අවස්ථාවල දී විශ්‍රාමිකයා හා භාරකරු යන දෙදෙනා ම එක ම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයක පදිංචි වී සිටිය යුතු ය. එමෙන් ම එම මුදල් වලින් විශ්‍රාමිකයා නඩත්තු කරන බවට (සිහිවිකල/ ආබාධිත විශ්‍රාමිකයා සාත්තු නිවාසයක/ වැඩිහිටි නිවාසයක හෝ රණවිරු සෙවණක නවතා ඇති විට විශේෂයෙන්) මාස 03 න් 03 ට ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත වාර්තා කළ යුතු අතර ප්‍රාදේශීය ලේකම් විසින් එය අධීක්ෂණය කළ යුතු ය.

V. මාසිකව ග්‍රාමනිලධාරී හරහා ලබාගත් සහතිකයක් මත තැපැල් කාර්යාලයෙන් භාරකරුට ගෙවීම් කළ යුතු ය.

VI. යම් සුවිශේෂී අවස්ථාවක විශ්‍රාමිකයාගේ විශ්‍රාම වැටුප භාරකරුගේ බැංකු ගිණුමට හැරවිය යුතු නම් ඒ සඳහා විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබා ගෙන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ මාසික විශ්‍රාම වැටුප් ගෙවීම් අංශයට භාරකරුගේ ගිණුම් අංකය හා විස්තර දන්වා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලිපියක් යොමු කළ යුතු ය. (භාරකරුගේ ගිණුමට මුදල් බැර කිරීම එතැන් සිට ආරම්භ වන අතර විශ්‍රාමිකයාගේ ගිණුමට මුදල් බැරවීම නතර වේ.)

මාලිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை கொழும்பு 10. Maligawatta, Colombo 10.
Hot line: 1970, Direct line: 2209800, Fax: 2342078, Email: info@pensions.gov.lk, Web: www.pensions.gov.lk

VII. භාරකරු විසින් විශ්‍රාමිකයාගේ විශ්‍රාම වැටුප, විශ්‍රාමිකයාගේ යහපත සඳහා ම යොදා ගත යුතු ය. භාරකරු ලබාගන්නා විශ්‍රාමිකයාට හිමි විශ්‍රාම වැටුප, විශ්‍රාමිකයාගේ යහපතට යොදා නොගන්නා බවට පැමිණිලි ලැබී ඒ බව තහවුරු වුවහොත් එවැන් අවස්ථාවල පවත්නා නෛතික විධිවිධාන අනුව ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බවට භාරකරු දැනුම්වත් කළ යුතු ය.

VIII. විශ්‍රාමිකයා මියගිය විට ගිවිසුම ප්‍රකාරව භාරකරු විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් වහාම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව දැනුම්වත් කළ යුතු අතර භාරකරු වෙත විශ්‍රාමිකයා නමින් කළ ගෙවීම් අත්හිටුවීම හා මුදල් භාරකරුට ගෙවා තිබුණහොත් අයකර ගත යුතු යි.

IX. භාරකරු මියගියහොත් නව භාරකරුවෙක් පත්කර පෙර පරිදි ම ක්‍රියා කළ යුතු යි.

ඒ.ජගත් ඩී.ඩයස්
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් :-

1. විගණකාධිපති - කාරුණික දැන ගැනීම සඳහා
2. අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව - කාරුණික දැන ගැනීම සඳහා
3. ප්‍රධාන අභ්‍යන්තර විගණක (විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව) - කාරුණික දැන ගැනීම සඳහා